# පාරිසරික නිලධාරී තනතුර

## පරිසර හිතකාමී ව්‍යාපෘතිය II (ඊ-ෆ්‍රෙන්ඩ්ස්) චක්‍රීය අරමුදල

ශ්‍රී ලංකාවෙහි පරිසර හිතකාමී කර්මාන්ත සංවර්ධනය සඳහා රජයේ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් සඳහා ක්‍රියාශීලී, ප්‍රතිඵල දිශානතික අයවලුන් සඳහා ඇබෑර්තුවක් පවතී.

ඒ අනුව, කර්මාන්තය හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින්, පහත සඳහන් තනතුර සඳහා පහතින් විස්තර කොට ඇති අවශ්‍ය සුදුසුකම් සතු ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වගකීම් :**

පාරිසරික නිලධාරීවරයා, ව්‍යාපෘති අධ්‍යක්ෂක, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක හා මූල්‍ය අධ්‍යක්ෂක වෙත වර්තා කළ යුතු අතර, පාරිසරික ව්‍යාපෘති යේජනා වෙනුවෙන් ලද තක්සේරු වාර්තා ඇගයුම් කිරීමට සහයවීම හා යෝජිත ඊ-ෆ්‍රෙන්ඩ්ස් II ණය ආධාර වැඩසටහන යටතේ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය කළ යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධියක් (සිවිල් ඉංජිනේරු / යාන්ත්‍රික ඉංජිනේරු / පාරිසරික විද්‍යා)

කාර්මික පාරිසරික ආරක්ෂණ ව්‍යපෘති අධීක්ෂණය කිරීමේ හා ඇගයුම් කිරීමේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

මනා පරිගණක සාක්ෂරතාවය සහ සිංහල හා ඉංග්‍රීසි භාෂාවල හොඳ සන්නිවේදන කුසලතා

පාරිසරික විද්‍යා පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

**වයස් සීමාව :** අවුරුදු 50 ට අඩු විය යුතුය.

**පොදු කොන්දේසි :**

ඉහත තනතුරට පත්කිරීම කොන්ත්‍රාත් පදනමින් සිදු කෙරේ. මෙම පත්කිරීම නිසාවෙන් ස්ථිර පත්කිරීමක් සඳහා කිසිදු හිමිකමක් නොලැබේ.

2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ නියමිත පරිදි වැටුප් ගෙවීම සිදු කෙරේ. (වැටුප රුපියල් – 75,000/–)

එම තනතුර සඳහා අයදුම්පත් භාර ගැනීම, 2016.11.12 වන දින අවසන් කෙරේ.

උනන්දුවක් දක්වන හා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්, තම සුදුසුකම්, පළපුරුද්ද හා ජීව දත්ත ඇතුළු සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර මෙම දැන්වීමේ සඳහන් අයුරු සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**73/1, ගාලු පාර,**
**කොළඹ 03.**